ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු** නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශේෂ පිරික්සුම අනුව දෙපාර්තමේන්තුව විසින් රැස් කර තිබූ රජයේ කැලෑවලින් ලැබෙන ආදායම (ආදායම් ශීර්ෂය - 2002-01-02) රු. 853,449,591 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 01 ආකෘතියේ එම ආදායම රු. 935,449,591 ක් ලෙස දක්වා තිබීමෙන් රු.82,000,000 කින් දෙපාර්තමේන්තුව විසින් රැස්කල ආදායම වැඩියෙන් දක්වා තිබුණි. තවද SA 21 පරිසණක මුද්‍රිත අනුව එම ආදායම් සංකේතය යටතේ වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස් කල ආදායම රු.120,274,588 ක් වුවද, එය ඒසීඒ 01 ආකෘතියේ රු. 38,274,588 ක් ලෙස රු. 82,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි	දෙපාර්තමේන්තුව විසින් රැස්කළ ආදායම් හා දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් ශීර්ෂයන් රැස්කළ ආදායම් ලෙස නිවැරදිව විභේදනය කළද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ දී , විගණනය විසින් පෙන්වා දී ඇති දෝෂය සිදුව ඇත.	ශේෂ පිරික්සුම සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව නිවැරදි සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම .
(ii)	ඒසීඒ 01(i) හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙහි වර්ෂ ආරම්භක ශේෂය ලෙස දැක්විය යුත්තේ පසුගිය වර්ෂයේ හා ඊට පෙර වර්ෂයන්හි හිඟ මුදල්වල ආරම්භක ශේෂයන් පමණක් වුවද, එක් එක් වසරේ අවසාන ශේෂය ඊළඟ වසරේ ආරම්භක ශේෂ ලෙස ආරම්භක ශේෂ තීරුවේ දක්වා තිබීමෙන් හිඟ ආදායම්වල ආරම්භක ශේෂයේ මුළු එකතුව රු.2,069,474,187 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද එම ප්‍රකාශනයෙහි, වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් තීරුවෙහි සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදල් පමණක් දැක්විය යුතු වුවද, පසුගිය වසරෙහි හා ඊට පෙර වර්ෂයන්හි හිඟ ශේෂයන්ද එම තීරුවෙහි දක්වා තිබීමෙන් වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදලේ මුළු එකතුව රු. 218,637,752 ක් වැඩියෙන් දැක්විණි.	ඉදිරි මුදල් වර්ෂවලදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශයන්ට තොරතුරු ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	පූර්ව වර්ෂවලට අදාල හිඟ ආදායම් ශේෂ හිඟ ආදායම් ප්‍රකාශනයේ ආකෘතියට අනුකූලව නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වීම.

(iii)	සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදල සමාලෝචිත වර්ෂයේදීම අය කර ගැනීමක් සිදු නොවන නමුත් ඒසීඒ 1(i) හි සාවද්‍ය ලෙස වාර්තා කරනු ලබන වර්ෂයට අදාල හිඟ මුදල් අය කිරීම් රු.3,882,476 ක් දක්වා තිබුණි.	ඉදිරි මුදල් වර්ෂවලදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයන්ට තොරතුරු ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	හිඟ ආදායම් අයකර ගැනීම් නිවැරදිව හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුය.
(iv)	සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ (ඒසීඒ-1) හිඟ ආදායම් රැස්කිරීම් කිසිවක් දක්වා නොතිබූ නමුත් හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-1(i)) හිඟ ආදායම් අයකර ගැනීම්වල එකතුව ලෙස රු.1,750,652,632 ක් දක්වා තිබුණි.	ඉදිරි මුදල් වර්ෂවලදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයන්ට තොරතුරු ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුම්වත් කර ඇත.	හිඟ ආදායම් අයකර ගැනීම් නිවැරදිව හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුය.
(v)	2009 සිට 2019 දක්වා වර්ෂවල සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම හා වනජ ද්‍රව්‍ය වෙනුවෙන් අයවිය යුතු රු. 317,624,265 ක ආදායම් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණ නමුත් එය ඒසීඒ 01 (i) හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි මුදල් වර්ෂවලදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයන්ට තොරතුරු ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුම්වත් කර ඇත.	සියළු හිඟ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් ඒවා අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වීම.

(ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශවලට අදාල පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒසීඒ 2(i) ආකෘතියෙහි වැය විෂයය 1101 - දේශීය ගමන් වියදම් ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් ලෙස රු. 8,830,000 ක් දක්වා තිබුණද, වර්ෂය තුලදී එවැනි මාරු කිරීමක් සිදුකර නොතිබුණි. තවද වැය විෂයය 1409 - වෙනත් සේවා වියදම් ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් ලෙස රු. 9,200,000 ක් දක්වා තිබුණද, සත්‍ය වශයෙන් එම වැය විෂය යටතේ මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් රු.3,800,000 ක් විය.	ඉදිරි මුදල් වර්ෂවලදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයන්ට තොරතුරු ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් නිවැරදිව දක්වා ඒ අනුව වැය විෂයයන්වල ශුද්ධ ප්‍රතිපාදනය නිවැරදිව දැක්විය යුතු වීම.
(ii)	අග්‍රිම ගැලපුම් ප්‍රකාශය අනුව වෙනත් ආයතන විසින් වාර්තා කරන ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් එකතුව රු. 4,996,735 ක් වුවත්, එය වියදම් පිළිබඳ ප්‍රකාශය ඒසීඒ 2(ii) හි මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යංශය/දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් තීරුවට එක් එක් වැය විෂයය යටතේ ඇතුළත් නොකර මුදල් පොතට අනුව වියදම් තීරුවට එකතු කර දක්වා තිබුණි.	ප්‍රමාද දෝෂයක් හේතුවෙන් එම මුදල ඇතුළත් වී නොමැත. ඉදිරියේ දී නිවැරදිව ගිණුම් පිළියෙල කිරිමට නිළධාරින්ට උපදෙස් දී ඇත.	මූල්‍ය ප්‍රකාශනවලට අදාල තොරතුරු නිවැරදිව සටහන් කළ යුතු වීම.

(ඇ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ භාණ්ඩාගාර පරිසනක මුද්‍රිත (එස්.ඒ 82) අනුව 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් අයිතම 06 ක ශේෂයන්වල එකතුව රු. 4,714,970,273 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එම ශේෂයන්වල එකතුව රු. 9,159,853,958 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.4,444,883,685 ක් වැඩියෙන් දැක්විණි.	සිගාස් වැඩ සටහනට වත්කම් ඇතුලත් කිරිම තුළ දෙපාර්තමේන්තුවට නිරාකරණය කරගත නොහැකි ගැටලු ඇති වී ඇති අතර, එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර ඉන් ලබා දෙන උපදෙස් අනුව, වත්කම් ගැලපීමට කටයුතු කරනු ඇත.	මූල්‍ය නොවන වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.

(ඇ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත SA 52 අනුව අනිකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්වල එකතුව රු.10,297,208 ක් වුවද, අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය තුල එය රු. 10,130,804 ක් ලෙස රු.166,404 ක් අඩුවෙන් ගලපා තිබුණි.	SA 52 අනුව අත්තිකාරම් බී ගිණුමට කරන ලද සියලු බැර කිරීම්වල වටිනාකම රු. 10,297,208 කි. අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද බැර කිරීම් වල වටිනාකම රු. 10,120,829 කි. එය අග්‍රිම ගැලපුම් ප්‍රකාශයේ දැක්විය විය යුතු වුවත් ප්‍රමාද දෝෂයකින් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැලපුම් කර ඇත්තේ රු. 10,130,804 ක් ලෙසය.	අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ සඳහන් කළ යුතු ශේෂයන් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වීම.

(ඉ) විගණන සාක්ෂි නොවීම

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (එස්ඒ 82) ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස වත්කම් අයිතම 03 කට අදාලව එකතුව රු. 4,711,937 ක් දක්වා තිබුණද, ඒවා තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ලබා දෙන උපදෙස් අනුව, වත්කම් ගැලපීම විධිමත් කරනු ඇත.	මූල්‍ය නොවන වත්කම්වලට එකතු කර ඇති අයිතමයන් හා ඒවායේ වටිනාකම සනාථ කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කලයුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් අයිතම 06ක ආරම්භක ශේෂය රු.4,444,883,685 ක් වැඩියෙන් දක්වා තිබුණි.	1.6.1(ඇ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව		මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ) (i)	වර්ෂය ආරම්භයේ පැවතිය යුතු හිඟ ආදායම් ශේෂය , හිඟ අදායම් අයකර ගැනීම් පූර්ව වර්ෂ වලටද බලපාන අකාරයට නිවැරදි ව හිඟ අදායම් ප්‍රකාශයේ ගැලපුම් කළ යුතු විම.	1.6.1(අ) (ii)
1.6.1 (අ) (ii)	රජයේ කැලෑවලින් රැස්කළ ආදායම් (2002.01.02) ශීර්ෂය යටතේ හා වෙනත් ආයතන විසින් රැස්කර තිබූ ආදායම අදාල පරිදි නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු විම.	1.6. 1(අ) (i)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 2002-01-02 යටතේ රජයේ කැලෑවලින් ලැබෙන ආදායම මූලිකව රු. 1,600,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, වර්ෂය තුළදී රු. 973,578,228 ක් පමණක් රැස් කරගෙන තිබීම හේතුවෙන් රු. 626,421,772 කින් හෙවත් සියයට 39 කින් ආදායම් සීමාව ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.	ආදායම් සංකේත අංක 2002.01.02 රජයේ කැලෑවලින් ලැබූ ආදායම රු. 973,578,228 කි. එම වර්ෂයේ එහි හිඟ ආදායම රු. 515,646,000 ක් වූ අතර ආදායම හා හිඟ ආදායමෙහි එකතුව 1,489,224,228 කි. ඇස්තමේන්තුගත ආදායම හා සැසඳීමේ දී විචලතාවය රු. 110,775,772. එම ආදායම නොලැබීමට හේතුන් ඇස්තමේන්තු කළ ආකාරයට සංචාරකයින්ගේ නොපැමිනීම, බිම් කට්ටි වෙත ළගා වීමේ අපහසුතාවය හා හෙක්ටයාරයකට ප්‍රමාණවත් ගස් ප්‍රමාණ යක් නොතිබීම හේතුවෙන් සමහර සමාගම් විසින් රේසින් නිස්සාරණයට ඉදිරිපත් නොවීම, රටෙහි උද්ධමනය වැඩිවීම හේතුවෙන් ගොවීන් වානිජ වගාවන් සඳහා පැළ මිළ දී ගැනීම අඩු වීම, වෙළඳපළෙහි ආදේශක භාණ්ඩයන් වැඩිවීම හා ඊට	අයකරගත හැකි ආදායම උපරිම කර ගැනීමට හා නිවැරදිව ආදායම් ඇස්තමේන්තු සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

සාපේක්ෂව ලී භාණ්ඩයන් හි මිළ වැඩිවීම නිසා පාරිභෝගිකයින් ලී භාණ්ඩ මිළ දී ගැනීම අඩුවීම හා ඒ හේතුවෙන්, අපේක්ෂිත පරිදි දැව ව්‍යාපාර ලියාපදිංචිය සිදු නොවී ඇත.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථනයන් සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වැය විෂයයන් 02 ක ශුද්ධ ප්‍රතිපාදනයේ එකතුව වූ රු. 13,800,000 න් රු. 4,303,552 ක් එනම් සියයට 28 ක් හා සියයට 74 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයක ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.6,900,000 න් රු. 4,020,767 ක්, එනම් සියයට 58 ක ඉතිරිවීම් පැවතුණි.	ඉදිරි මුදල් වර්ෂයන්හි දී වියදම් ඇස්තමේන්තු දෙපාර්තමේන්තුවේ සත්‍ය අවශ්‍යතාවයන්ට අනුව නිවැරදිව සකස්කරන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලදී.	මු.රෙ. 50 ප්‍රකාරව හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු සකස් කර වියදම් කළමණාකරණය කරගත යුතුවීම.
(ආ)	මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් පුනරාවර්ථන වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු. 1,198,000,000 කින් රු. 39,894,300 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන් වෙත මාරුකර තිබියදී, 2024 දෙසැම්බර් 31 දිනට එම වැය විෂයන්ගේ තවදුරටත් රු.106,381,625 ක් එනම් සියයට 5 ත් සියයට 58 ත් අතර පරාසයක ඉතිරිවීම් පැවතිණි.	ඉදිරි මුදල් වර්ෂයන්හි දී ප්‍රතිපාදන මාරු කිරීම් අවමවන ලෙස, ඇස්තමේන්තු සකස් කිරීමට සටහන්කර ඇත.	මු.රෙ. 50 අනුව සත්‍ය අවශ්‍යතාවයන්ට අනුව නිවැරදි වියදම් ඇස්තමේන්තු සකස් කර වියදම් කළමණාකරණය කරගත යුතුවීම.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අවස්ථා 68 කදී රු. 1,709,272 ක වියදම් 2025 පළමු මාස 02 ක තුලදී නිරවුල් කර තිබුණු අතර මෙම වියදම් මුල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 වන විට හදුනාගෙන තිබූ බැඳීම් ඇතුලත් කර ඇත. ඉන් පසු ඉදිරිපත් වූ වවුචර්පත් මු.රෙ 115 අනුමැතිය යටතේ ගෙවීම් කර ඇත.	වර්ෂයට අදාල බැරකම් හඳුනාගෙන ඒවා මුල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත 224 වගන්තිය	-	ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් සිදුකර විධිමත්ව පවරා ගැනීමට කටයුතු සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටෙයාර 79.38 ක ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ හෙක්. 81.28 ක ඉඩම් ප්‍රමාණයෙන් හෙක්. 1.9 ක ප්‍රමාණයක් පමණක් මේ වන විට අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇත.	රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
(i)	මුදල් රෙගුලාසි 396	974,058	බැංකු ගිණුම් 11 කට අදාලව 2024 දෙසැම්බර් 31 වන විට නිකුත් කර මාස 06 ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	2025 මැයි මාසයේ බැංකු සැසඳුම් සකස් කිරීමේ දී අදාළ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ 396 අනුව කටයුතු කරන ලෙස නිළධාරින් දැනුවත් කරන ලදී.	මාස 6 ක් ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

(ii)	මුදල් රෙගුලාසි 571(3)	327,280,296	සමාලෝචිත වර්ෂය අවසානයට වසර 02 ක් ඉක්මවූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.	මුදල් රෙගුලාසි විධිවිධාන අනුව , ඉකුත් තැන්පත් නියාදනය කිරීමට , නිලධාරීන් දැනුවත් කරන ලදී.	වසර 2 ඉක්මවූ තැන්පතු සම්බන්ධ යෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමනිර්දේශය	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී අවසන් වූ පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිට අදාල නිල බැංකු ගිණුම් 33 ක් අක්‍රීයව පැවතියද, 2024 දෙසැම්බර් 31 දිනට ඒවා මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණු අතර එම ගිණුම් වසා දැමීමටද කටයුතු කර නොතිබුණි.	මෙම බැංකු ගිණුම් අතරින් ගිණුම් 15 ක් වසා දැමීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2024 දෙසැම්බර් 28 දින මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. කටයුතු අවසන් වූ තවත් ගිණුම් 10 ක් 2025 මැයි මාසය තුලදී අනුමැතිය සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරමි. ඉතිරි ගිණුම් 08 මෙම වර්ෂය තුලදී වසා දැමීමට කටයුතු කරනු ඇත.	ව්‍යාපෘති අවසන් වීමෙන් පසු අක්‍රිය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට එක් බැංකු ජංගම ගිණුමකට අවස්ථා 36 කදී සෘජුව බැරවී තිබූ රු.34,610,497 ක් සම්බන්ධයෙන් කාලීනව පොත්පත් හා ලේඛන සමග සැසඳීම් කර හඳුනා නොගැනීම නිසා මුදල් පොතට ගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 මැයි මාසයේ බැංකු සැසඳුම් සකස් කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත.	ජංගම ගිණුමට සෘජුව බැරවී ඇති මුදල් හඳුනාගෙන ඒවා කාලීනව හා නිවැරදිව ගිණුමගත කිරීමට කටයුතු කළ යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වන සංරක්ෂණ ආඥා පනතේ 3(2) ආඥාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර 512 ක් සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කර තිබුණද, එම සැලසුම් වලින් සැලසුම් 459 ක් අනුමත කර නොතිබීම නිසා ආඥා පනතේ 3(3) ආඥාව අනුව එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ සිට වන කළමනාකරණ සැලසුම් සකස් කිරිමට පටන් ගත්තද, ලැබී ඇති සීමිත ප්‍රතිපාදන හේතුවෙන් එක් අවුරුද්දකට වන කළමනාකරණ සැලසුම් 50 කට සීමා වීමට සිදුවිය. කෙසේ නමුදු වාර්ෂික වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ ඉලක්කය වන කළමනාකරණ සැලසුම් 50 ව තිබුනද ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් ගේ කැපවීම සහ ප්‍රධාන කාර්යාලය මගින් ලබාදුන් උපදෙස් මත එම ඉලක්කය අභිබවා වන කළමනාකරණ සැලසුම් සකස් කර ඇත. එසේම සැලසුම් අනුමත කිරිම සඳහා වන නීතිමය පසුබිම සකස් වන්නේ 2023 අගෝස්තු 21 දින අනුමත කරන ලද සංරක්ෂණ ආඥා පනතේ නියෝග වලින් පසුව වේ.	ආඥා පනතේ සඳහන් ආකාරයට අප්‍රමාදීව වන කළමණාකරණ සැලසුම් සකස් කර අනුමත කර ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු වීම.
(ආ)	රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ මූලික අරමුණු වන ජෛව විවිධත්වය, පස සහ ජලය සංරක්ෂණය, ජාන සම්පත හා දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන හා සත්ත්ව හා වෘක්ෂලතා විශේෂ සුරක්ෂිත කිරීම වුවද, වනාන්තර 897 ක් රක්ෂිත හා සංරක්ෂිත ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර වර්ෂ 01 ත් 19 ත් දක්වා වූ දීර්ඝ කාලයක් ගත වී තිබුණද, එම කළමනාකරණ සැලසුම අනුමත නොවීම මත රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ ඉහත අරමුණු ඉටු වී නොතිබුණි.	වන සංරක්ෂණ ආඥා පනතේ 3(2)(1) වගන්තිය අනුව රක්ෂිත වනාන්තර සඳහා ද, 3අ(3) වගන්තිය අනුව සංරක්ෂිත වනාන්තර සඳහා ද වන සංරක්ෂක ජනරාල් විසින් වන කලමනාකරණ සැලසුම් සකස් කළ යුතු වුවද, එහි **1** වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් ඒ සඳහා වන රෙගුලාසි ගැසට මගින් ප්‍රකාශයට පත් කළ යුතුය. ඒ අනුව 2021 රෙගුලාසි ගැසට් කිරීමෙන් අනතුරුව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා මඟ පෙන්වීම ලැබිණි. ඒ අනුව, 2021 වර්ෂයේ සිට වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත.	ආඥා පනතේ සඳහන් ආකාරයට අප්‍රමාදීව වන කළමණාකරණ සැලසුම් සකස් කර අනුමත කර ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු වීම.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ගම්පහ දිසාවට අයත් ගම්පහ අඩවියේ වනාන්තර 13 ක් හා මීරිගම අඩවියේ වනාන්තර 19 ක් GPS තාක්ෂණය මඟින් හා මැනුම් දෙපාර්තමේන්තුව විසින් මැනුම් කර ඇතත්, විගණන දිනය වූ 2025 ජනවාරි 24 වන විටත් රක්ෂිත සහ සංරක්ෂිත ලෙස ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.	" තිරසාර වනාන්තර කළමනාකරණය තුලින් ඉඩම් ගැටළු නිරාකරණය කිරිම" වැඩසටහන උතුරු හා නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්කයන්හි අවසන් වූ වහාම දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලද මෙම වැඩසටහන තුලින් ගැසට් නොවූ වනාන්තර රක්ෂිත ලෙස ගැසට් කිරිමටද, ගැටළු සහිත වනාන්තර මායිම් සමාලෝචනය කිරිමට ද නියමිතව ඇත.	සංරක්ෂිත / රක්ෂිත වනාන්තර ගැසට් කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 දෙසැම්බර් 18 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත එකක් රු. 502,000 (වැට් රහිත) මිලකට ඩ්‍රෝන කැමරා 05 ක් මිලදී ගැනීමට 2023 දෙසැම්බර් 18 දිනැති ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණද එකී සීමාව ඉක්මවා රු.3,463,800 කට ඩ්‍රෝන කැමරා 06 ක් මිලදී ගෙන තිබුණි. එකී මිලදී ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.11 ප්‍රකාරව ලබා ගත යුතු ලංසු සුරක්ෂණ ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	ඉදිරිපත් තිබූ මිල ගනන් අතුරින් මිලදි ගැනීමට තීරණය කරන ලද ඩ්‍රෝන කැමරා 05 සඳහා වැයවන මුදල සැලකිල්ලට ගැනීමේදී වෙන් කර තිබූ මුළු ප්‍රතිපාදන සීමාව තුළ තවත් එක් ඩ්‍රෝන කැමරාවක් මිලදී ගැනීමට හැකියාව පවතින බැවින් එම මුදල් ප්‍රතිපාදන භාවිතයට ගනිමින් තවත් එක් ඩ්‍රෝන කැමරාවක් මිලදී ගෙන ලබා දෙන ලෙසට අංක DFC/PLE/2/2/9 2023 හා 2023.12. දින රහිත ලිපිය මගින් ප්‍රසම්පාදන කමිටු සභාපති වෙත ඉල්ලීමක් යොමු කර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත මෙම මිලදී ගැනීම සිදුකර ඇත.	ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර දෙපාර්තමේන්තු අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම.
(ආ)	2023 දෙසැම්බර් 27 දින ප්‍රධාන කාර්යාලයට ලැබී තිබූ ඩ්‍රෝන කැමරාවක් ත්‍රිකුණාමල දිසාවන කාර්යාලයට භාර දීමට මාස 06 ක කාලයක් ගත කර තිබීමෙන් වසරක වගකීම් කාලයක් සහිතව මිලදී ගෙන තිබූ මෙම කැමරාව වගකීම් කාලයෙන් හරි අඩක් ගෙවී යන තෙක් භාවිතයට ගෙන නොතිබුණි.	ඩ්‍රෝන කැමරා භාවිතය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණුවක් ත්‍රිකුණාමලය දිසාවේ අදාල නිලධාරීන් වෙත ලබා දීමෙන් අනතුරුව 2024 ජුනි 18 දින ත්‍රිකුණාමලය දිසාව වෙත ඩ්රෝන කැමරාවක් නිකුත් කරන ලදී.	දෙපාර්තමේන්තු අවශ්‍යතා හඳුනාගෙන භාණ්ඩ මිලදී ගැනීමත් ඒවා අවශ්‍යවන දිසාවන කාර්යාලවලට අප්‍රමාදව ලබා දීමටත් කටයුතු කලයුතුවීම.
(ඇ)	ඩ්‍රෝන කැමරා භාවිතය පිළිබඳව විධිමත් පුහුණුවක් නිලධාරීන්ට ලබා දීමට සහ ඒවායේ නඩත්තු හා සේවා කිරීම් සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවධානය යොමු කර නොතිබූ අතර, ඒ සම්බන්ධව ලංසු ලේඛනවල විධිවිධාන ඇතුළත් කර නොතිබුණි.	තාක්ෂණ ඇගයීම් කමිටුවේ මූලික එකඟතාවය මත ඩ්‍රෝන උපකරණ මිලදී ගැනීම සඳහා පිරිවිතර සකස් කළ අතර, එම කමිටුවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පමණක් නොව ඩ්‍රෝන උපකරණ සම්බන්ධ සියලු කටයුතු නියාමනය කරන ශ්‍රී ලංකාවේ අධිකාරී බලයලත් ආයතනය වන සිවිල් ගුවන් සේවා අධිකාරියේ සිවිල් ගුවන් සේවා පර්යේෂණ (නියමුවන් රහිත ගුවන් යානා පද්ධති) නිලධාරීවරයකු, ආරක්ෂක අමාත්‍යාංශයේ තාක්ෂණ අංශයේ සන්නිවේදන උපදේශකවරයෙකු සහ ගණකාධිකාරවරයෙකු ගෙන් සමන්විත විය. ඔවුන් සියලු දෙනාගේ තීරණය වූයේ ඩ්‍රෝන භාවිතය සම්බන්ධ පුහුණුවක් පිරිවිතර වලට ඇතුලත් කිරීම ගැටලු සහගත විය හැකි බවයි.	ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේදී මිලදී ගන්නා උපකරණ වල නඩත්තු හා සේවා කිරීම් සඳහාද අවධානය යොමුකර ලංසු ලේඛන සකස් කළ යුතු වීම.

4.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව සතු ධාවනයෙන් තොරව පවතින රු. 14,035,000 ක් පිරිවැය වූ වාහන 143 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙනත් ආයතන සතු වාහන 10 ක් වන සංරක්ෂක ජනරාල්ගේ නමින් පවරා ගැනීමට කටයුතු සිදු කරන අතර අබලි ලෙස අපහරණය කිරීමට නියමිත වාහන 99 ක් අතුරින් 65 ක් ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එයින් වාහන 29 ක ලියාපදිංචිය අවලංගු කර ඇත. ඒ අනුව එම වාහන 29 අබලි ද්‍රව්‍ය ලෙස කඩිනමින් අපහරණය කිරීමට නියමිතය.	ධාවනයට යෙදවිය හැකි වාහන අළුත්වැඩියා කිරීමට සහ අළුත්වැඩියා කර ධාවනය කල නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම.

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 සිට 2023 දක්වා වූ කාලය තුල සිදුව තිබූ රු. 1,037,314 ක් වූ හානි හා පාඩු සිද්ධි 10 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත්, 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 11 ක කාලය තුල සිදු වූ රු. 5,493,264 ක්වූ හානි හා පාඩු සිද්ධි 15 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමටත් 2025 අප්‍රේල් 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	අලාභ හානි සිද්ධීන් 10 ක් සම්බන්ධයෙන් මු.රෙ 104 අනුව ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ලබා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කර එම ලිපි ගොනු වල ඉදිරි කටයුතු යාවත්කාලීන කරනු ඇත.	අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා කඩිනමින් ඉදිරිපත් කළ යුතු වීම.
(ආ)	2022 හා 2024 වර්ෂවලදී සිදු වූ පාඩු හා අලාභ හානි සිද්ධීන් 03 ක අලාභය 2025 අප්‍රේල් 11 දින වන විටත් තක්සේරු කර නොතිබුණි.	අලාභ හානි සිද්ධීන් සම්බන්ධයෙන් තක්සේරු කටයුතු සිදුකර නොපමාව වාර්තා ගෙන්වා ගැනිමට අදාල නිළධාරින් දැනුවත් කර ඇත.	අලාභ හානි නිවැරදිව හා ප්‍රමාදයකින් තොරව තක්සේරු කර ලේඛණවලට ඇතුලත් කළ යුතු වීම.

4.6 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	හොරකැලේ පැල තවාන තුල 2022 වර්ෂයේදී නිෂ්පාදනය කල 2025 ජනවාරි 23 දිනට රු. 800,000 ක් වටිනා රුට් බෝල්ට් පැල 160 ක් පැවති අතර ඒවා නිෂ්පාදනය කල අවශ්‍යතාවයට නිකුත් නොකිරීම හේතුවෙන් තවාන තුල පැලවී තිබුණි. තවද 2019, 2020 හා 2022 වර්ෂවල නිෂ්පාදනය කල රු. 294,050 ක් වටිනා පැල 1577 ක් එම බඳුන්වල අධි වර්ධනය වී තිබුණි	වසර 02 ක් 03 ක් පමණ කාලයක් තිස්සේ නඩත්තු කරනු ලබන පැල අධි වර්ධනය වීම සාමාන්‍ය තත්ත්වයකි. ව්‍යාපෘති සංවර්ධන කටයුතු වර්ෂ අවසානය වන තෙක්ම අවසන් නොවූ බැවින් පැල සිටුවීම අත්හිටුවා තිබුණි. මේ නිසා මෙම පැල තවානේ අධි වර්ධනයවී පැවතුනි. නමුත් මේ වනවිට ව්‍යාපෘතිවල කටයුතු නිම වෙමින් පවතින අතර මීලග ලෝක පරිසර දිනය වනවිට එම ව්‍යාපෘතිවලට අදාල ස්ථාන කිහිපයකම මෙම පැල රුක් රෝපණයට සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ඇත.	අවශ්‍යතාවය අනුව පැළ නිෂ්පාදනය කිරීමත් අධිවර්ධිත පැළ වහාම නිකුත් කිරීමටත් කටයුතු කළ යුතු වීම.

4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තු කාර්යක් වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමගින් පාංශු සහ ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම කළ යුතු වුවත් 2025 ජනවාරි 24 දින ගම්පහ දිසාවට අයත් අලවල සංරක්ෂිතය භෞතික විගණන පරීක්ෂාවට ලක් කිරීමේදී අවිධිමත් ලෙස ඉවත් කර තිබූ ප්ලාස්ටික්, පොලිතීන් හා වෙනත් නොදිරන කසල සංරක්ෂිතයට හා ආශ්‍රිත ඇල මාර්ග වලට බැහැර කර තිබුණි. මෙය ස්වාභාවික පරිසර පද්ධතින්ගේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම හා සංරක්ෂිතයේ තිරසර පැවැත්මට තර්ජනයක් වී තිබුණි.	කසල බැහැර කිරීමේ කටයුත්ත සඳහා ඉදිරියේදී අත්තනගල්ල ප්‍රදේශීය සභාවේ අවධානය යොමු කිරීම සඳහා කාර්යභාර නිලධාරි වෙත මා දැනුම් දී ඇති අතර Alumex ආයතනය මගින් මෙම ස්ථානයේ ඇති කසළ බහාලුම් කිහිපයට අමතරව තවත් බහාලුම් කිහිපයක් ලබා දීමට එකඟතාවය පලකර ඇත. තවද මෙම ස්ථානයේ කසළ බැහැර කිරීම සඳහා IUCN (International Union oF Conservation & Nature) ආයතනයේ සහභාගිත්වයෙන් දැන්වීම් පුවරු 10 ක් සවිකර ඇතත් මෙහි පැමිණෙන පිරිස විසින් කරනු ලබන ක්‍රියාකාරකම් අවම කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සමාජ වන හා වන ව්‍යාපෘති වැඩසටහන යටතේ කටයුතු කර ඇත.	දෙපාර්තමේන්තුවේ අරමුණක්වූ වන සම්පත් ආරක්ෂා කර ගැනීමට කටයුතු කලයුතුවීම.

(ආ)	හෙක්ටයාර 15.15 ක වපසරියකින් යුක්ත හොරකැලේ රක්ෂිත වනාන්තරයේ හෙක්ටයාර 10 ක ප්‍රමාණයක 2018 වර්ෂයේ දි වන වගා සිදු කර තිබුණි. මෙම වන වගාව 2020 වර්ෂයේ පෙබරවාරි 23 සහ 24 දෙදින තුල හෙක්ටයාර 03 ක් හා පර්චස් 60 ක් ද ,2022 වර්ෂයේ මාර්තු 05 දින හෙක්ටයාර 04 ක් ද ගිනිගෙන තිබූ අතර 2023 වර්ෂයෙන් පසුව ගිණිපටි නඩත්තු කිරීමක්ද සිදුකර නොතිබුණි.	මෙම වර්ෂයේ ද ප්‍රතිපාදන ලැබී ඇති අතර ගිනි පටි විවෘත කිරීම ආරම්භ කර ඇත. මීට අමතරව 2023 වර්ෂයේදී මෙන් ප්‍රජාව දැනුවත් කිරීමත්, වියළි කාල වලදී නිලධාරින් ගිනි වැළැක්වීමේ කටයුතු වලට සූදානම්ව තැබීමත් සුපුරුදු පරිදි සිදු වේ.	ගිනිගැනීමෙන් වන හානි අවම කර වනය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඇ)	ගම්පහ දිසාවට අයත් මීතිරිගල රක්ෂිතය 1895 මැයි 22 දින රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් කර තිබුණු අතර එහි ඉඩම් කොටස් 76 ක් අනවසරයෙන් අල්ලා ගැනීම හේතුවෙන් 2018-2021 දක්වා කාලය තුල අස්කිරීම් දැන්වීම් ඉදිරිපත් කර තිබුණි. මෙම අස්කිරීම් දැන්වීම් සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් එම අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීම වෙනුවට එම ගැටළු සහිත භූමිය රක්ෂිත භූමියෙන් ඉවත් කර 2021 අප්‍රේල් 08 දින නැවත ගැසට් කිරීමට ක්‍රියාකිරීම තුල හෙක්ටයාර 44.9ක් හෙවත් අක්කර 112 ක වනාන්තර ප්‍රමාණයක් මීතිරිගල රක්ෂිතයට අහිමිවී තිබුණි.	පැරණි රක්ෂිතයට අයත් සේද ගොවිපල වෙත නිකුත් කරන ලද ඉඩම් හා අනෙකුත් අනවසර වගා බිම් සඳහා වන අපරාධ ගොනු කොට අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර එම භූමි නව රක්ෂිත මායිමෙන් ඉවත්කර ඇති බැවින් නඩු කටයුතු පවත්වා ගෙන යා නොහැකි බවට නීතිපති උපදේස් ලබා දී ඇත. ඒ අනුව අධිකරණයේ පැවති නඩු ඉවත් කර ගෙන ඇති අතර එම වන අපරාධයන්ට අදාලව නෙරපීම් නියෝග ඉල්ලා ඇතත් ඒ සඳහා නෙරපීම් නියෝග ලැබී නොමැත.	වන අපරාධ සම්බන්ධව නෙරපීම් නියෝග ලබාගෙන එම කටයුතු අවසන් කළ යුතු වීම හා රක්ෂිතය ආරක්ෂා කර ගත යුතු වීම .
(ඈ)	දෙපාර්තමේන්තුවේ හිඟ සේවක ණය තුල අවුරුදු 01ට වැඩි මිය ගිය නිලධාරීන් 13 දෙනෙකුගේ රු.1,166,806 ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 30 කගෙන් රු.2,537,628 ක් ද, වැඩ තහනම් කර ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු. 2,331,959 ක් ද, සේවය හැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,509,343 ක් ද වශයෙන් එකතුව රු. 7,545,736 ක මුදලක් අයවිය යුතුව තිබුණි.	2025 ජනවාරි 24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024(I) යටතේ නිලධාරින්ගේ හිඟ ණය ශේෂයන් පොත් වලින් කපා හැරීම සඳහා 2025.03.28 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා 2025 වර්ෂයට අදාලව වැය විෂයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත.හිඟ ණය ශේෂ අදාල නිලධාරින්ගේ මරණ, විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. එලෙස අයකරගත නොහැකි ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	මියගිය, විශ්‍රාම ගිය , වැඩ තහනම් කර ඇති , සේවය හැර ගොස් ඇති නිලධාරීන්ගේ හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම.

5. **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන ඉලක්ක යටතේ කදුකර ජෛව විවිධත්වය සඳහා වැදගත් ආරක්ෂිත ප්‍රදේශ/භූමි ආවරණය සිදු කිරීමට හදුනාගෙන තිබුණද, 2024 වර්ෂයේ මෙම තිරසර සංවර්ධන ඉලක්කය ඉටු කර ගැනීම සඳහා කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි.	තිරසාර අන්දමින් කළමනාකරණය කිරිම යටතේ වන විනාශය වැළැක්වීම සඳහා 2020 වර්ෂයෙන් පසුව වනාන්තර150ක හෙක්ටයාර් 74,461,603 ක ප්‍රමාණයක් රක්ෂිත ලෙස ගැසට් කර ඇත.ඒවා තුල මිරිදිය පරිසර පද්ධතින්ද රක්ෂිත භූමියට ඇතුලත් වේ.එලෙස වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරිම මගින් ඒවායේ ආරක්ෂාවද තහවුරු වී ඇත.	කඳුකර ජෛව විවිධත්ව සඳහා වැදගත් ආරක්ෂිත තිරසර සංවර්ධන ඉලක්කයන් ළඟාකර ගැනීමට පියවර ගත යුතු වීම.

6. **මානව සම්පත් කළමනාකරණය**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 3259 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් 564 ක් පුරප්පාඩුව පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්මට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 25 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 26ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 113 දෙනෙකු හා බීට්ටු වන නිළධාරීන් 166 දෙනෙක් ද ඒ අතර විය. එම තනතුරු පුරප්පාඩුව පැවතීම ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැලැක්වීම හා දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි සෘජුවම බලපෑ හැකිව තිබුණි.	කළමනාකරණ සේවා නිලධාරි, කාර්යාල කාර්ය සහායක සහ රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත.තවද උක්ත තනතුරු සියල්ලෙහිම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති නිලධාරී කමිටුව වෙත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මානව සම්පත් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.